# 1980 දශකයෙන් පසු ලොව පුරා පළාත් පාලන ආයතන ප්‍රතිසංස්කරණ ව්‍යාප්තවීම සඳහා බලපාන ලද හේතු සාධක පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක්

එච්. ඒ. සී. ඩී. කුමාරි*

## සංක්ෂේපය

*පළාත් පාලනය වූ කලි නීතියෙන් අවසර ලැබී ඇති සේවා සැපයීමකි. පළාත් පාලනය ගත් විට එක් එක් පළාත්බද ශාඛා ඇති මධ්‍ය කාර්යාලයක් මගින් පාලනය කරන දේශව්‍යාප්ත ව්‍යාපාරයක් ලෙස හඳුනාගත හැකිය. යම් කිසි ප්‍රදේශයක වාසය කරන්නවුන්ගේ යහපත පිණිස අතුරු ව්‍යවස්ථා ඇති කිරීමේ බලය සහිත පරිපාලන වූ ත් විධායක වූ ත් බල ඇති ඡන්ද බලයෙන් තෝරාගනු ලැබූ පළාත්බද ආයතන මගින් කෙරෙන පාලනය පළාත් පාලනය වේ. අදාළ ප්‍රදේශයේ ජනතාවගේ පහසුව සුබ විහරණය හා යහපැවැත්ම වෙනුවෙන් සේවා සැපයීම අවශ්‍ය වේ. මෙකී අරමුණ මුදුන්පත් කරවා ගැනීමේ අභිලාශය පදනම් කොටගෙන 1980 දශකයෙන් අනතුරුව පළාත් පාලන ප්‍රතිසංස්කරණ ලොව පුරා ව්‍යාප්තවීම හඳුනාගත හැකිය. එතෙක් මධ්‍ය බල අධිකාරිත්වයෙන් පරිපාලන කටයුතු සිදු වූ අතර එයින් පැන නගින්නා වූ දුර්වලතාවන් නිසාවෙන් සෑම රාජ්‍යයක් පාහේ ඉන් ලිහිල්වීමේ අවශ්‍යතාවය ස්මතු විය. බොහොමයක් රාජ්‍යයන් ආණ්ඩුකරණයේ දී හා පරිපාලන කටයුතුවල දී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග එක හා සමාන ස්වරූපයක් ගැනීම ද විශේෂයෙන් හඳුනාගත හැකි විය. විමධ්‍යගතකරණ ක්‍රියාවලිය ඔස්සේ මෙසේ සෑම රාජ්‍යයක්ම පාහේ බලය විමධ්‍යගතකරණය කිරීමට අවශ්‍යය පියවර අනුගමනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් ලොව පුරා 1980 දශකයෙන් අග භාගය පමණ*

* devikakumari376@gmail.com